# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 76 — 1973 සැප්තැම්බර් 07 වැනි සිකුරාදා — 1973.09.07

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


## I වැනි කොටස: (II ආ) වැනි ඡේදය — පළකිරීම්

(වෙන වෙනම ගොනුකර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක්එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | 1177 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | 1183 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... ... | 1185 | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම් ... ... | 1188 |
| කොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... ... | 1188 | විවිධ දැන්වීම් ... ... ... | — |


## ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

තැපැල් හා විදුලි සංදේශ දෙපාර්තමේන්තුව

බෝල හණ ලණු සැපයීම

බෝල හණ ලණු සැපයීම සඳහා කොළඹ, තැපැල් හා විදුලි සංදේශ මූලස්ථාන ගොඩනැගිල්ලේ දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් 1973 සැප්තැම්බර් මස 24 වැනි දින පෙ. ව. 10 වන තෙක් මෙරට නිෂ්පාදකයින්ගෙන් ටෙන්ඩර් භාර ගනු ලැබේ.

2. 1973 සැප්තැම්බර් මස 24 දින පෙරවරු 10 ට ටෙන්ඩර්පත්‍ර විවෘත කරනු ඇත. ටෙන්ඩර්පත්‍ර විවෘත කරන වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට එහි පැමිණ සිටිය හැක.

3. කොළඹ 5, නාරාහේන්පිට, සහකාර අධිකාරි (උපකරණ, ගොඩනැගිලි, සුභසාධක හා ගබඩා) කාර්යාලයෙන් නිකුත් කරන ආකෘති පත්‍රවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය.

4. ප්‍රධාන තැපැල් කාර්යාලයේ අංක 4 දරණ කවුළුවේ රු. 50 ක මුදලක් තැන්පත් කර රිසිට් පතක් ලබා ගෙන, එම රිසිට් පත ඉදිරිපත් කළ විට, අවශ්‍ය ටෙන්ඩර් ෆෝරම නිකුත් කරනු ලැබේ. 1973 සැප්තැම්බර් මස 07 දින සිට 1973 සැප්තැම්බර් මස 21 වැනි දින දක්වා කාර්යාල වේලාවන් තුල ටෙන්ඩර් ෆෝරම නිකුත් කරනු ලැබේ.

5. වැඩි විස්තර කොළඹ, නාරාහේන්පිට, සහකාර අධිකාරි (උපකරණ, ගොඩනැගිලි, සුභසාධක හා ගබඩා) කාර්යාලයෙන් ලබා ගත හැක.

ඒ. ආර්. එම්. ජයවර්ධන,
පෝස්ට්මාස්ටර් ජනරාල් සහ විදුලි සංදේශ අධ්‍යක්ෂ.

තැපැල් හා විදුලි සංදේශ මූලස්ථාන ගොඩනැගිල්ල,
කොළඹ 1.

9-67/1 —73.09.07 දින අංක 76 දරණ ගැසට් පත්‍රය

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශෙෂ නිවේදනයයි**

ශ්‍රී ලංකා ජනරජයේ සතිපතා පළවන ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II අ) සහ (II ආ) වැනි ඡේදයෙහි පළවිය යුතු දැන්වීම් ගැසට් පත්‍රය පළවන සතියට පෙර සතියේ බදාදා දවල් 12.00 ට පෙර රජයේ මුද්‍රණාලයට ලැබිය යුතුයි. ප්‍රමාදවී ලැබෙන දැන්වීම් කුමන හේතුවක් නිසාවත් බාරගනු නොලැබේ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 දෙසැම්බර් මස 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

## තැපැල් හා විදුලි සංදේශ දෙපාර්තමේන්තුව

### යකඩ සෝප්පු සැපයීම සඳහා ටෙන්ඩර් කැඳවීම

යකඩ සෝප්පු සැපයීම සඳහා කොළඹ, තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ, මූලස්ථාන ගොඩනැගිල්ලේ, දෙපාර්තමේන්තු ටැන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් 1973. 09. මස 24 වැනි දින පෙ. ව. 10 වන තෙක් මෙරට නිෂ්පාදකයින්ගෙන් ටැන්ඩර් භාර ගනු ලැබේ.

2. 1973. 09. මස 24 වැනි දින පෙ. ව. 10.10 ට ටැන්ඩර් විවෘත කරනු ඇත. ටැන්ඩර්කරුවන්ට විවෘත කරන වේලාවේ දී පැමිණ සිටිය හැක.

3. කොළඹ, නාරාහේන්පිට පිහිටි තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ උපකරණ, ගොඩනැගිලි, සුභසාධක හා ගබඩා කට යුතු පිළිබඳ සහකාර අධිකාරී කාර්යාලයෙන් නිකුත් කරන ආකෘති පත්‍රවල ටැන්ඩර් ඉදිරිපත් කළ යුතුය. වැඩි විස්තර ද එම කාර්යාල යෙන් දැන ගත හැක. ප්‍රධාන තැපැල් කාර්යාලයේ අංක 4 දරණ කවුන්ටරයේ රු. 50 ක මුදලක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කිරීමෙන් අවශ්‍ය ආකෘතිපත්‍ර ලබා ගත හැක. ටැන්ඩර් ආකෘති පත්‍ර 1973. 09 මස 07 වැනි දින සිට 73. 09. 21 දින ප. ව. 3.30 දක්වා නිකුත් කරනු ලැබේ.

ඒ. ආර්. එම්. ජයවර්ධන,
පෝස්ට්මාස්ටර් ජනරාල් සහ විදුලි සංදේශ අධ්‍යක්ෂ.

තැපැල් හා විදුලි සංදේශ මූලස්ථාන ගොඩනැගිල්ල,
කොළඹ 1.

9—67/2 —73.09.07 දින අංක 76 දරණ ගැසට් පත්‍රය

---

## තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුව

### පික් වර්ගයේ ගිස්වැසුම්

පික් වර්ගයේ ගිස්වැසුම් සැපයීම සඳහා කොළඹ තැපැල් හා විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ මූලස්ථාන ගොඩනැගිල්ලේ, දෙපාර්ත මේන්තු ටැන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින්, 1973. 09. 24 දින පෙ. ව. 10 වන තෙක් ටැන්ඩර් භාර ගනු ලැබේ.

2. 1973. 09. 24 වැනි දින පෙරවරු 10 ට ටැන්ඩර් පත්‍ර විවෘත කරනු ඇත. ටැන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවේදී ටැන්ඩර්කරුවනට එහි පැමිණ සිටිය හැක.

3. කොළඹ 5, තැපැල් හා විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ, සහකාර අධිකාරී (උපකරණ, ගොඩනැගිලි, සුභසාධක හා ගබඩා) කාර්යාලයේ නිකුත් කරනු ලබන ආකෘතිපත්‍රවල ටැන්ඩර් ඉදිරිපත් කළ යුතුය.

4. ප්‍රධාන තැපැල් කාර්යාලයේ, අංක 4 දරණ විමසීම් කවුළුවේ රු. 50ක මුදලක් තැන්පත් කර කුවිතාන්සියක් ලබා ගෙන, එම කුවි තාන්සිය ඉදිරිපත් කළ විට, ටැන්ඩර් ඉදිරිපත් කරලීම සඳහා අවශ්‍ය ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ. ටැන්ඩර් ආකෘතිපත්‍ර නිකුත් කරනු ලබන්නේ 1973. 09. 07 වැනි දින සිට 1973. 09. 21 වැනි දින දක්වා පමණකි.

5. වැඩි විස්තර කොළඹ 5, තැපැල් හා විදුලි සංදේශ දෙපාර්ත මේන්තුවේ සහකාර අධිකාරී (උපකරණ, ගොඩනැගිලි, සුභසාධක හා ගබඩා) කාර්යාලයෙන් ලබා ගත හැක.

ඒ. ආර්. එම්. ජයවර්ධන,
පෝස්ට්මාස්ටර් ජනරාල් සහ විදුලි සංදේශ අධ්‍යක්ෂ.

තැපැල් සහ විදුලි සංදේශ මූලස්ථානය,
කොළඹ 1.

9—67/3 —73.09.07 දින අංක 76 දරණ ගැසට් පත්‍රය

---

## තැපැල් සහ විදුලි සන්දේශ දෙපාර්තමේන්තුව

### සිබ් යතුරු පුවරු (කෝඩ් සහිතව හෝ කෝඩ් රහිතව) සැපයීම හා ගෙනවිත් භාරදීම

පහත සඳහන් වර්ගයේ යතුරු පුවරු සැපයීම හා ගෙනවිත් භාර දීම සඳහා, කොළඹ 1, ලෝටස් පාරේ තැපැල් සහ විදුලි සන්දේශ මූලස්ථාන ගොඩනැගිල්ලේ, 6 වෙනි මහලේ තැපැල් සහ විදුලි සන්දේශ දෙපාර්තමේන්තු ගැණුම්පත් මණ්ඩලයේ සභාපති විසින් 1973 ඔක්තෝබර් මස 05 දින පෙරවරු 10 දක්වා ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

| යතුරු පුවරු වර්ගය | ප්‍රමාණය |
|---|---|
| 1. ප්‍රධාන මාර්ග එකයි දිගු තුනයි | 5 |
| 2. ප්‍රධාන මාර්ග දෙකයි දිගු හතරයි | 5 |
| 3. ප්‍රධාන මාර්ග තුනයි දිගු නවයයි | 20 |
| 4. ප්‍රධාන මාර්ග පහයි දිගු විස්සයි | 30 |
| 5. ප්‍රධාන මාර්ග දහයයි දිගු හතලිහක්, පණහක් හෝ හැටක් | 20 |

2. කොළඹ 1, ලෝටස් පාරේ පිහිටි ඉහත සඳහන් තැපැල් සහ විදුලි සන්දේශ මූලස්ථානයේ 5 වෙනි මහලේ ප්‍රධාන විදුලි සන්දේශ ඉංජිනේරු කාර්යාලයෙන් ලබාගත් ෆෝරම පිටපත් දෙකකින් යුක්තව, ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුතුයි. ඉහත සඳහන් කාර්යාලයේදී ටෙන්ඩර් ලියකියවිලි පරීක්ෂාකර බැලීමටද, අවශ්‍ය විස්තර දැන ගැනීමට ද පුළුවන.

3. කොළඹ 1, මධ්‍යම විදුලි පණිවුඩ කාර්යාලයේ විදුලි පණිවුඩ කැෂියර් වෙත හෝ තැපැල් කාර්යාලයක ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රු. 250 ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සිය ඉහත කී ප්‍රධාන විදුලි සන්දේශ ඉංජිනේරු කාර්යාලය වෙත ඉදිරිපත් කිරීමෙන් 1973 ඔක්තෝබර් මස 02 දින දවල් 12 වන තෙක් බලාපොරොත්තු වන ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් ෆෝරම ලබාගත හැකිය.

ඒ. ආර්. ඇම්. ජයවර්ධන,
පෝස්ට්මාස්ටර් ජනරාල් සහ
විදුලි සන්දේශ අධ්‍යක්ෂ.

පාලන අංශය, 6 වෙනි මහල,
තැපැල් සහ විදුලි සන්දේශ මූලස්ථානය,
ලෝටස් පාර, කොළඹ 1.

9-63 —73.09.07 දින අංක 76 දරණ ගැසට් පත්‍රය

---

## ලංකා ගමනාගමන මණ්ඩලය

### ටෙන්ඩර් දැන්වීමයි

1974 වර්ෂයට අවශ්‍ය මුද්‍රිත ෆෝර්ම සහ රෙජිස්තර (ඉංජිනේරු හා මුදල්) මුද්‍රණය කර සැපයීම සඳහා සීල් තැබූ ටෙන්ඩර් පත්‍ර කොළඹ 5, කිරුළ පාරේ, අංක 200 වෙනි ස්ථානයෙහි පිහිටි ලංකා ගමනා ගමන මණ්ඩලීය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1973. 10. 10 වෙනිදා පෙරවරු 10 වන තෙක් භාර ගනු ලැබේ.

ටෙන්ඩර් පත්‍ර නියමිත ෆෝර්මවල ලියා අනුපිටපතකින්ද යුක්ත කොට එවිය යුතුයි. මෙම ෆෝර්ම පත් වේරහැර, බොරලැස්ගමුවේ පිහිටි ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රධාන සම්පාදක නිලධාරි තැනගේ කාර්යාලයෙන් 1973. 10. 09 වෙනි දින දවල් 12 වන තෙක් ලබාගත හැකිය. ෆෝර්ම පත් ලබා ගැනීමට වේරහැර, බොරලැස්ගමුවේ ලංකා ගමනාගමන මණ්ඩලයේ නියෝජ්‍ය ප්‍රධාන ගිණුම් නිලධාරී තැන වෙත මුදලින් රු. 100 තැන්පත් කර ඒ වෙනුවෙන් ලබා ගන්නා ලද රිසිට් පත ඉදිරිපත් කළ යුතුයි. ටෙන්ඩර් පත්‍රිකා ගාස්තු වශයෙන් රු. 10ක මුදලක් ද මෙයට අමතරව අය කරනු ලැබේ.

වැඩි විස්තර මෙම කාර්යාලයෙන් ලබා ගත හැක.

ප්‍රධාන සම්පාදක නිලධාරී තැන,
ලංකා ගමනාගමන මණ්ඩලය.

සම්පාදක කොට්ඨාශය,
වේරහැර,
බොරලැස්ගමුව.
1973.08.22.

9-95 —73.09.07 දින අංක 76 දරණ ගැසට් පත්‍රය

4. 1973 සැප්තැම්බර් 21 වෙනි දින අ. භා. 12.30 ට ටෙන්ඩර් විවෘත කරනු ලබන වේලාවේදී සියළුම ටෙන්ඩර්කරුවන් හට පැමිණීමට ඉඩ දෙනු ලැබේ.

5. ටෙන්ඩර් පත පිළිගැනීමෙන් පසු එම ටෙන්ඩර් පත ඉදිරිපත් කළ ටෙන්ඩර්කරුට ගිවිසුමකට බැඳෙන ලෙස ලියවිල්ලකින් දන්වනු ලැබේ. කොන්ත්‍රාත්තු කරනු ලබන මුදලින් සියයට 2ක් (2%) සාර්ථක ලෙස නිම කිරීමට ඇප වශයෙන් ඔහු විසින් තැන්පත් කළ යුතුය. මෙසේ තබන ලද මුදල් සාර්ථක ලෙස වැඩ නිම කරන තෙක් ආපසු ගෙවනු නොලැබේ. ටෙන්ඩර් පත පිළිගැනීමෙන් පසු එය ඉදිරිපත් කළ ටෙන්ඩර්කරු හට මෙසේ දැනුම් දී දින 10ක් ගෙවීමට පෙර ගිවිසුමකට බැඳීමට ඔහු අපොහොසත් වුවහොත් ඔහුගේ තැන්පත් මුදල වන රු. 25 රාජසන්තක කරනු ලැබේ.

6. නියම කරන ලද වැඩ ප්‍රමාණයෙන් සියයට අනූවක් (90%) දක්වා මුදල් ගෙවනු ලැබේ. ඉතිරි සියයට දහය (10%) ඉහත 5 වැනි ඡේදයෙහි දක්වා ඇති පරිදි තැන්පත් මුදලක් සමග සාර්ථක අන්දමින් වැඩය නිම කර මාස තුනක් ගතවූ පසු ගෙවනු ලැබේ.

එම්. ශ්‍රී ෂන්මුගරාජා,
භූමි සම්පාදන සහකාර අධ්‍යක්ෂ,
මන්නාරම දිසාපති වෙනුවට.

1973 අගෝස්තු මස 20 වෙනි දින,
මන්නාරම දිසාපති කාර්යාලයේදී ය.

9–38—73.09.07 දින අංක 76 දරණ ගැසට් පත්‍රය

---

මගේ අංකය : 3/25/10.

ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

මාතලේ දිස්ත්‍රික්කයේ පහත සඳහන් තැනීම් වැඩ සඳහා 1973 සැප්තැම්බර් මස 21 වැනි දින පස්වරු 2.30 දක්වා කොළඹ, තැ. පෙ. 500, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ.

| වැඩෙහි ස්වභාවය | ප්‍රා. ආ. නි. කොටස | ලියාපදිංචි විය යුතු මුදල රු. |
|---|---|---|
| 1. කැඳන්ගමුව ජනපද පාර තැනීම 3/25/10/139 | දඹුල්ල | 35,000 |
| 2. වෙරළුගස් තැන්න-මැදවත්ත පාර මුල් කොටස සැ. 4½ ක් තැනීම 3/25/10/6 | රත්තොට | 25,000 |
| 3. මැටිහක්ක ජලනල ව්‍යාපාරය තැනීම 3/25/11/129 | රත්තොට | 12,000 |
| 4. මාතලේ, ඕවලවත්ත ජලනල ව්‍යාපාරය III පියවර 3/25/11/56 | මාතලේ | 20,000 |

2. ඉහත සඳහන් වැඩ ඉදිරියෙන් සඳහන් කර ඇති ප්‍රමාණයට හෝ ඊට වැඩි ගණනකට රජයේ දෙපාර්තමේන්තුවල කොන්ත්‍රාත්කරුවන් වශයෙන් ලියා පදිංචි වී ඇති ග්‍රාම සංවර්ධන සමිති, කම්කරු සමිති සහ සමූපකාර සමිතිවලට සහ ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ටද, 73. 9. 18 වැනි දින දවල් 11 තෙක් ටෙන්ඩර් පෝරම මාතලේ කච්චේරියෙන් නිකුත් කරනු ලැබේ.

3. ටෙන්ඩර් පෝරම අපේක්ෂකයන් විසින් මාතලේ කච්චේරියේ වැඩය වෙනුවෙන් රු. 100 ක මුදලක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් මාතලේ දිසාපති වෙත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝරමය නිකුත් කරනු ලැබේ. ග්‍රාම සංවර්ධන සමිති, කම්කරු සමිති හා සමූපකාර සමිති ටෙන්ඩර් පෝරම ලබා ගැනීමට මුදල් තැන්පත් කිරීම අනවශ්‍යය. චෙක්පත්, මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම්, ආදිය භාරගනු නො ලැබේ.

4. ටෙන්ඩර් පෝරම සම්පූර්ණකර පිටපත් දෙකකින් යුක්තව ලේඛනගත තැපෑලෙන් එවිය යුතුය. ටෙන්ඩරය බහා එවන කවරය මුද්‍රා තැබිය යුතු අතර, කවරයේ උඩ වම් කෙළවරේ වැඩෙහි නම ලියා තිබිය යුතුයි. ටෙන්ඩර් පෝරම තැපෑලෙන් නො එවන්නෝ නම් ගාලු මුවදොර මහා ලේකම් කාර්යාලයේ අංක. 320 දරණ කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි තැන්පත් කළ යුතුයි.

5. 73. 9. 21 වැනි දින පස්වරු 2.30 ට ඉහත කී අංක 320 දරණ කාමරයේදී ටෙන්ඩර් විවෘත කරනු ලැබේ.

6. මේ කොන්ත්‍රාත්තුව යටතේ වූ වැඩ කරවා ගැනීමට පුහුණු හා නුපුහුණු දෙවර්ගයේම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට එකඟවිය යුතු අතර එවැනි කම්කරුවන් හැකි තරම් දුරට බඳවා ගත යුත්තේ වැඩය කෙරෙන ප්‍රදේශයේ සිටින අය අතුරෙනි.

7. කොන්ත්‍රාත්තුවේ මේ කොන්දේසි සපුරාලීමට කොන්ත්‍රාත්කරුවා යම්කිසි විදියකින් අසමත් වුවහොත්, කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමට එය තුඩු දෙනවා ඇත. එහෙත් කොන්ත්‍රාත්තුවට එළඹෙන ලද නිලධාරියා විසින් විශේෂ අවස්ථාවලදී කෘෂිකර්ම හා ඉඩම් පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්ගේ එකඟත්වය ඇතිව, නිශ්චිත ලියවිල්ලකින් එකී නිලධාරියා විසින් අනුමත කරන ලද ලාංකික නොවන කම්කරුවන් නියුක්ත කරවීමට කොන්ත්‍රාත්කරුට බලය දිය හැකිය.

එවැනි ලිඛිත බලයක් හා එකඟත්වයක් නොමැතිව, ලාංකික නොවන කම්කරුවන් යෙදවීම තහනම් වන අතර, එය කොන්ත්‍රාත්තුව කඩකිරීමක් ලෙස සලකනු ලැබේ.

මේ කොන්ත්‍රාත්තුවේ අභිප්‍රාය සඳහා "ලාංකික" යන්නෙන් පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කිරීමෙන් හෝ ලංකාවේ රටවැසියෙකු අදහස් කරන අතර, එවැන්නෙක් එකී පාඨයට ඇතුළත් වෙයි.

මේ කොන්ත්‍රාත්තුවේ කටයුතු සඳහා යොදවනු ලබන සෑම කම්කරු කොට්ඨාශයකටම සාධාරණවූද කම්කරුවන්ට වේතන ගෙවීම් සම්බන්ධයෙන් දැනට බලපවත්වන සහ මින් මතු ක්‍රියාත්මක වියහැකි සියළුම රෙගුලාසිවලට අනුකූලවූද වේතනයක් ගෙවීමට කොන්ත්‍රාත්කරු එකඟ විය යුතුය.

කොන්ත්‍රාත්කරු විසින් එකී වැඩය කෙරෙහි යොදවනු ලැබූ කම්කරුවන් හා සම්බන්ධව එහුගේ පතපොත, චෙක්රෝල් පොත්, පෙරෙව්වු පොත් සහ අනිකුත් ලිපි ලේඛණ පරීක්ෂාකර බැලීමට ඉඩම් කොමසාරිස් විසින් විධිමත් පරිදි බලය දෙනු ලැබූ ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ඕනෑම නිලධාරියෙකුට ඒවා පරීක්ෂා කිරීමට ඉඩදීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී.

8. ටෙන්ඩර් කරුවන්ට අවශ්‍ය වෙනත් තොරතුරු ඉල්ලුම් පතක් මගින් මාතලේ දිසාපතිගෙන් ලබා ගත හැකිය.

සී. ගමගේ,
මාතලේ දිසාපති.

1973 අගෝස්තු මස 23 දින,
මාතලේ දිසාපති කාර්යාලයේ දිය.

8–31 —73.09.07 දින අංක 76 දරණ ගැසට් පත්‍රය

---

කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

කොළඹ 1, බ්‍රිස්ටල් වීදියේ, හේමාස් ගොඩනැගිල්ලේ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් මොරටුවේ මෝස්තර මධ්‍යස්ථානයේ පාවිච්චිය සඳහා දැව, කඳන්, සම්, මැටි, වැලි ආදිය වැනි විවිධ වර්ගයේ අමු ද්‍රව්‍ය සැපයීම සඳහා දේශීය සැපයුම් කරුවන්ගෙන් 1973.09.28 දින පෙ. ව. 10 වනතෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. සියලු විස්තර හා ටෙන්ඩර් කොන්දේසි සඳහා කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ තැනගෙන් විමසන්න.

සෝමපාල ගුණධීර,
කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ.

යොමුව : 3/1—(5/35).
හේමාස් ගොඩනැගිල්ල,
කොළඹ 1, 1973.08.25.

9-62 —73.09.07 දින අංක 76 දරණ ගැසට් පත්‍රය

---

වාත්තු අඟුරු සැපයීම සඳහා ටෙන්ඩරය

1973 ඔක්තෝබර් මස 22 දින පෙරවරු 10 දක්වා ඉහත සඳහන් සැපයීම සඳහා ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ. රු. 100 ක ආපසු ලබා ගත හැකි ටෙන්ඩර් තැන්පත් මුදලක් ගෙවා අවශ්‍ය ටෙන්ඩර් පෝරම කොළඹ මෙම කාර්යාලයෙන් ලබා ගත හැක. ටෙන්ඩර් තැන්පත් මුදල් ටෙන්ඩරය අවසන් වන දිනට පළමු වැඩ කරන දින දහවල් 12 න් පසු භාර ගනු නොලැබේ. අවලංගු කරන ලද ටෙන්ඩර් පත් රු. 10 ක් ගෙවීමෙන් ලබා ගත හැක.

මිලට ගැනුම් කළමනාකාර.

ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාව,
තැ. පෙ. 670, 242, හැව්ලොක් පාර, කොළඹ 5.

9-42 —73.09.07 දින අංක 76 දරණ ගැසට් පත්‍රය

## ලංකා දුම්රිය සේවය

මන්නාරම දුම්රිය ස්ථානයේ තුන්වන පන්තියේ මගීන්ට ආහාර පානාදිය විකිණීමේ වරප්‍රසාදය එක් වර්ෂයක් සඳහා ලබා ගැනීම පිණිස කොළඹ 10 ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1973 සැප්තැම්බර් 28 වෙනි සිකුරාදා පෙ. ව. 10 වන තෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ. තවත් වර්ෂයකට හෝ දෙකකට මෙම කොන්ත්‍රාත්තුව දීර්ඝ කිරීමේ අභිමතයද සම්පූර්ණයෙන්ම ටෙන්ඩර් මණ්ඩලය සතුව ඇත.

2. මෙතෙක් මෙම දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි නොවූ මේ සම්බන්ධව සැලකිලිමත් වන ටෙන්ඩර් කරුවන් ඔවුන්ගේ නාමයෙන් ලියාපදිංචි කරන ලෙස ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ වාණිජ අධිකාරි වෙත පහත සඳහන් තොරතුරු අඩංගු කරමින් 1973 සැප්තැම්බර් මස 21 වැනි සිකුරාදා හෝ ඊට පෙර අයදුම් කළ යුතුය :—

(අ) මෙම වර්ගයේ ව්‍යාපාර ගැන කලින් ඇති පළපුරුද්ද සම්බන්ධව විස්තර සහිත ප්‍රකාශණයක්ද, පෙර පළපුරුද්ද, කායශක්ෂම සහ මුදල් ස්ථාවරත්වය පිළිබඳ අංක 1085/ටී/282/2/ඒ. හා 1961 මැයි මස 26 වෙනි දින දරන මහා භාණ්ඩාගාර චක්‍රලේඛනය අනුව අදාළ ප්‍රාදේශීය ආදායම් නිලධාරියාගෙන් සහතිකයක් ඉදිරිපත් කළ යුතුය ;

(ආ) ඉෂ්ඨ කරන ලද රජයේ කොන්ත්‍රාත්තු දක්වෙන ප්‍රකාශණයක් සහ එකී විස්තර ; සහ

(ඇ) ඉඩකඩම් දේපල හා වෙනත් ව්‍යාපාර සම්බන්ධකම් ද, එය පිහිටි දිස්ත්‍රික්කය හෝ දිස්ත්‍රික්ක ද දක්වෙන සම්පූර්ණ විස්තර අඩංගු ප්‍රකාශණ ; සහ

(ඈ) රජයේ කොන්ත්‍රාත්තු, කොන්දේසි කඩකල කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛණයට සිය නම ඇතුල් වී නැති බවට ප්‍රකාශණයක්.

3. කොළඹ 10, අංක 1, ඩී. ආර්. විජේවර්ධන මාවතේ දුම්රිය වාණිජ අධිකාරී කාර්යාලයෙන් ලබාගත යුතු ආකෘති පත්‍රවල (දෙපිටපතකින් යුතුව) ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. රු. 150 ටෙන්ඩර් තැන්පත් මුදලක් ප්‍රධාන දුම්රිය ගණකාධිකාරි කාර්යාලයේ හෝ කොළඹින් බැහැර නම් ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට, 1973 සැප්තැම්බර් මස 27 වෙනි බ්‍රහස්පතින්ද පෙ. ව. 10 දක්වා ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ.

4. මෙම ටෙන්ඩර් දැන්වීම් සහ විස්තර ප්‍රකාශනද සමග ටෙන්ඩර් මුද්‍රා තබා කොළඹ 10, අංක 1, ඩී. ආර්. විජේවර්ධන මාවතේ, දුම්රිය වාණිජ අධිකාරි භාරයේ ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩල සභාපති නමට ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. එසේ නැත්නම්, ලිපිනය සහ සේවයේ විස්තර කවරයෙහි සඳහන් කොට මුද්‍රා තබන ලද ටෙන්ඩර්, ටෙන්ඩර් මණ්ඩල සභාපති විසින් භාර ගැනීමට බලය පවරන ලද නිලධාරියෙකුට ටෙන්ඩර්කරුවන්ගේ හෝ ඔවුන්ගේ නියෝජිතයන් හෝ පැමිණ භාරදී එය භාරගත් බවට ඔහුගෙන් කුවිතාන්සියක් ලබාගත යුතුය. ඉහත සඳහන් නියමිත දිනය සහ වේලාවෙන් පසු ලැබෙන ටෙන්ඩර් භාරගනු නොලැබේ.

5. ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී එසේ කැමැත්තේ නම් ටෙන්ඩර් කරුවන්ටද පෙනී සිටිය හැක. 1973 සැප්තැම්බර් මස 28 වන සිකුරාද පෙ. ව. 10.30 ට දුම්රිය දෙපාර්තමේන්තුවේ වාණිජ අධිකාරි කාර්යාලයේදී ටෙන්ඩර් විවෘත කරනු ලැබේ.

6. ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනයේ සිට ඉදිරියට සති හයක කාලයක ටෙන්ඩර් පත්‍රවල සඳහන් කර ඇති ගණන් යෝජනා විවෘතව තැබිය යුතුය.

7. වැඩිදුර විස්තර වාණිජ අධිකාරී කාර්යාලයෙන් ලබාගත හැක.

සී. නඩරාජා,
වැඩ බලන දුම්රිය සාමාන්‍යාධිකාරී වෙනුවට.

අංක 1, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10.
1973 අගෝස්තු මස 17 දින.

9-85 —73.09.07 දින අංක 76 දරණ ගැසට් පත්‍රය

---

## වන සත්ව සංරක්ෂණ දෙපාර්තමේන්තුව

මෙහි පහත සඳහන් වැඩ සඳහා වෙන් වෙන් වශයෙන් ටෙන්ඩර් කැඳවනු ලැබේ. පිටපත් දෙකකින් පිළියෙල කරන ලද සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර 1973 සැප්තැම්බර් මස 21 වැනි දින පෙ. ව. 10 වන තෙක් මවිසින් බාරගනු ලැබේ :—

(i) මොණරාගල දිස්ත්‍රික්කයේ නිල්ගල පිහිටි වන සත්ව ආරක්ෂක නිලධාරීන්ගේ නිවාසය සහ මුළුතැන්ගෙය අළුත්වැඩියා කිරීම.

(ii) මොණරාගල දිස්ත්‍රික්කයේ බදුලුවෙල පිහිටි දෙපාර්තමේන්තු නිවාසය අළුත්වැඩියා කිරීම.

2. රු. 25,000 කට වැඩි කොන්ත්‍රාත්තු භාර ගැනීමට රජයේ දෙපාර්තමේන්තුවල ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ගෙන් පමණක් ටෙන්ඩර් බාරගනු ලැබේ.

3. 1973.09.10 සිට 1973.09.20 වැනි දින දක්වා වූ කාලය තුළ ප. ව. 3 දක්වා මෙම කාර්යාලයේ දී ටෙන්ඩර්පත් නිකුත් කරනු ලැබේ. ඉල්ලුම්කරුවන් විසින් රු. 50 ක ආපසු ගෙවනු ලබන තැන්පත් මුදලක් තැබිය යුතු අතර, මෙම වැඩය කිරීම සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ හා දක්ෂ කාර්ය මණ්ඩලයක් ඇති බව ඔප්පු කළ යුතුය. සෑම ටෙන්ඩර් එකක් සඳහාම වෙනම කවරයක් පාවිච්චි කළ යුතු අතර, එහි වම් කෙළවරේ වැඩය කුමක් ද යන වග විශේෂ වශයෙන් සඳහන් කර ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ මෙම කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය.

4. ගොඩනැගිල්ලේ නිර්මාණය ශාස්තු ප්‍රමාණයන් හා විස්තර පත්‍රිකාව මෙම කාර්යාලයේ දී 1973. 09. 19 වැනි දින දක්වා කායශීල වේලාවන් තුළ පරීක්ෂා කළ හැක.

5. ටෙන්ඩරයට අදාළ කොන්දේසි ටෙන්ඩර් ආකෘති පත්‍රයේ සඳහන් කර ඇත.

6. ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට පෙර ටෙන්ඩර්කරුවෝ ගොඩනැගිලි පරීක්ෂා කර බැලිය යුතුය. ගොඩනැගිලි පරීක්ෂා කිරීම සඳහා අවසර පත් මෙම කාර්යාලයෙන් ලබාගත හැක.

එස්. ඩී. සපරමාදු,
වන සත්ව සංරක්ෂණ අධ්‍යක්ෂ.

1973 අගෝස්තු මස 16 වෙනි දින,
කොළඹ 7, ගිරිගෝරිස් පාරේ,
29, වන සත්ව සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ දී ය.

9-58 —73.09.07 දින අංක 76 දරණ ගැසට් පත්‍රය

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

විදුලියෙන් ක්‍රියා කරවන වතුර පොම්පයක් සැපයීම සඳහා ටෙන්ඩර්

පැයට ගැලුම් 2,000 ධාරිතාවයකින් යුත් විදුලියෙන් ක්‍රියා කරවන වතුර පොම්පයක් සැපයීම සඳහා ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් 73. 09. 21 වන දින පෙරවරු 11 දක්වා ටෙන්ඩර් භාර ගනු ලැබේ.

2. ටෙන්ඩර් කරුවන් විසින් සැපයීම කළ යුත්තේ තිබෙන තොග යෙන් කිරුළපනයේ මධ්‍යම ගබඩාවට භාරදීමටය. ටෙන්ඩර්කරුවන් විසින් භාරදිය හැකි ඉතාම නුදුරු කාල සීමාව සඳහන් කළ යුතුය.

3. 1973. 09. 20 වෙනි දින දහවල් 12 තෙක් ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂතැනගෙන් ලබාගත හැකි ටෙන්ඩර් පෝර්මයක අනු පිට පතකුත් සමග ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තු කාර්යාලයේ හෝ කොළඹ යෝර්ක් විදියේ ලංකා බැංකු කාර්යාලයේ ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනගේ ගිණුමට හෝ කොළඹින් බැහැර කච්චේරියක හෝ රු. 25ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට මත්තෙන් ඉදිරිපත් කළ යුතුයි.

4. ටෙන්ඩර් පෝර්ම ආදිය ලබාගත් පසු ටෙන්ඩර් කිරීමට නොහැකි වූවන්ගේ ටෙන්ඩර් තැන්පත් මුදල් ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනයට හා නියමිත වේලාවට පෙර ඉදිරිපත් කළ හොත් පමණක් ආපසු ගෙවනු ලැබේ.

5. සියලු ටෙන්ඩර් කවරයන්හි වම් පස ඉහළ කෙළවරේ "විදුලියෙන් ක්‍රියා කරවන වතුර පොම්පයක් සැපයීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කොට ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ, එච්ලන් චතුරශ්‍රය, කොළඹ 1 යන ලිපිනයට එවිය යුතුයි. කවරයේ වම් පස පහළ කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය සඳහන් කළ යුතුයි. ටෙන්ඩර් ලියාපදිංචි කළ තැපෑලෙන් පුද්ගලික නියෝජිතයෙකුගේ මාර්ගයෙන් හෝ තමා විසින් හෝ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරි තැනට භාරදිය යුතුයි.

6. ටෙන්ඩර් ස්ථිර වූවාක් මෙන්ම කිසියම් වෙනස් කිරීමකට අදාළ නොවිය යුත්තේය. ටෙන්ඩර් සලකා බැලීමට ඇති හෙයින් විවෘත කළ දින සිට දින 30ක් යන තෙක් ඒවා ආපසු ගෙන්වා ගත නොහැකිය.

7. ටෙන්ඩර්කරුවන් සැපයීම පිළිබඳව සම්පූර්ණ විස්තරයක් ඉදිරිපත් කළ යුතුයි. පිළිගත් විස්තරයකට යම්කිසි වෙනස්වීමක් වෙතොත් ඒ බැව් සඳහන් කළ යුතුයි.

8. සාර්ථක වූ ටෙන්ඩර්කරු සැපයීම් පැහැර හැරියොත් තැන්පත් මුදල රාජසන්තක වනවා පමණක් නොව, රජයේ කොන්දේසි කඩ කරන කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයට ඔහුගේ නමද ඇතුළත් වන්නේ ය.

9. කොළඹ එච්ලන් චතුරශ්‍රයේ, ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේදී 1973. 09. 21 වැනි දින පෙරවරු 11 ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. කැමති ටෙන්ඩර්කරුවන්ට ඒ අවස්ථාවේදී පෙනී සිටිය හැක.

10. කිසියම් ප්‍රශ්න කිරීමක් නොමැතිව ටෙන්ඩරයක කොටසක් හෝ සම්පූර්ණයෙන්ම හෝ ප්‍රතික්ෂේප කිරීමට හෝ ටෙන්ඩරයේ කොටසක් පිළිගැනීමට අයිතිය රජය සතුය.

11. වැඩි විස්තර සඳහා ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධිකාරී ඉංජිනේරු තැනගෙන් විමසන්න.

පී. රත්නසිංහම්,
ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ වෙනුවට.

ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තු කාර්යාලය,
කොළඹ, 1973 අගෝස්තු මස 28,
සීපී/2/453

9-69—73.09.07 දින අංක 76 දරණ ගැසට් පත්‍රය

---

ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

අම්පාර දිස්ත්‍රික්කයේ මෙහි පහත සඳහන් පාර තැනීම සඳහා 1973 සැප්තැම්බර් 14 වෙනි දින පෙ.ව. 10 දක්වා අම්පාර දිස්ත්‍රික්කයේ දිසාපති විසින් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

| වැඩයේ නම | ලියාපදිංචිවිය යුතු මුදල |
|---|---|
| දිගාමඩුල්ල ගම්සභා ප්‍රදේශයේ රණමඩු වේ සිට 10 ජනපදය මැදින් මධ්‍යම කඳ දක්වා ඇති පාරේ 13 ජනපදයේ 23 නිවාසය ලඟට ඇති කොටස ... | රු. 15, 000 |

2. ඉහත සඳහන් කර ඇති වැඩය ඉදිරියෙන් සඳහන් කර ඇති මුදල හෝ ඊට වැඩි ගණනකට කොන්ත්‍රාත් කරවැන් වශයෙන් රජයේ දෙපාර්තමේන්තුවල ලියාපදිංචිව ඇති කොන්ත්‍රාත්කරුවන්ට හා ලියාපදිංචිවී ඇති සමිති සමාගම්වලට 1973.09.13 වෙනි දින පස්වරු 2 දක්වා අම්පාර දිසාපති විසින් ටෙන්ඩර් ෆෝරම් නිකුත් කරනු ලබේ. ලියාපදිංචි හා අනිකුත් අදාල ඇ සනාථ කිරීම සඳහා ලියවිලි ඉදිරිපත් කළ යුතුය.

3. ටෙන්ඩර් ෆෝරම අපේක්ෂකයින් විසින් අම්පාර දිසාපති කාර්යාලයේ එකී එක් එක් වැඩය වෙනුවෙන් ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් රු. 50 ක් බැගින් තැන්පත් කොට ලබා ගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් ෆෝරම ලබා ගත හැකිය. චෙක්පත්, මුදල් ඇනවුම් හා තැපැල් අනවුම් ආදිය භාරගනු නොලබේ. අනුමත කරන ලද ග්‍රාමසංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුලත් සංගම් ටෙන්ඩර් තැන්පත් මුදල් ගෙවීමෙන් නිදහස් කරනු ලැබේ. එහෙත්, ඉහත දැක්වෙන මුදල් ප්‍රමාණයන්ට ලියාපදිංචිවී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කිරීමෙන් පසු පමණක් එම සමිතිවලට ටෙන්ඩර්පත් නිකුත් කරනු ලැබේ.

4. ටෙන්ඩර් ෆෝරම සම්පූර්ණ කොට පිටපත් දෙකකින් යුක්තව ලේඛනගත තැපැලෙන් එවිය යුතුය. ටෙන්ඩර් පත්‍රය බහා එවන කවරයේ මුද්‍රා තැබිය යුතු අතර, කවරයේ ඉහල වම් කොළවරේ වැඩෙහි නම ලියා තිබිය යුතුය. ටෙන්ඩර් ෆෝරම තැපැලෙන් නොඑවන්නේ නම්, අම්පාර දිසාපති කාර්යාලයේ ඉඩම් ශාඛාවේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය යුතුයි.

5. 1973 සැප්තැම්බර් මස 14 වෙනි දින පෙ. ව. 10 ට ටෙන්ඩර් ෆෝරම විවෘත කරනු ලැබේ. එදින ටෙන්ඩර්කරුවන්ට අවශ්‍ය නම් පැමින සිටිය හැක.

6. තමන්ගේ ටෙන්ඩර් පත්‍රය භාරගනු ලැබූ බවට ලිපියකින් දැන්වූ පසු, දින 14 ක් ඇතුලත ගිවිසුම පත්‍රය අත්සන් කිරීමට හා නියමිත ඇපය තැබීමට අපොහොසත් වුවහොත්, ඔහු විසින් ටෙන්ඩර් ෆෝරම ලබා ගැනීම සඳහා තැන්පත් කරන ලද මුදල, රාජසන්තක කරනු ලැබේ. ඇප මුදල ජයග්‍රාහක ටෙන්ඩර් මුදලින් සියයට පහක් වේ.

7. ජයග්‍රාහී ටෙන්ඩර්කරුට භාර දෙන ලද කොන්ත්‍රාත්තුවේ වැඩ කර ගෙන යන අතර, කොටස් මුදල් ලබා ගැනීමට අවශ්‍ය වුවහොත්, එවැනි අවස්ථාවලදී කරන ලද වැඩවලට තක්සේරු කරන වැඩවල වටිනාකමෙන් සියයට අනූවකට සරිලන ප්‍රමාණයේ මුදලක් ලබා ගත හැකිය.

8. ටෙන්ඩර් කරවන්ට අවශ්‍ය වෙනත් විස්තර ඇත්නම්, අම්පාර දිසාපති කාර්යාලයේ, ඉඩම් අංශයෙන් දැන ගත හැකිය.

එස්. විජයසිංහම්,
අම්පාර දිස්ත්‍රික්කයේ දිසාපති වෙනුවට.

1973 අගෝස්තු මස 24 දින,
අම්පාර දිසාපති කාර්යාලයේදීය

9-3—73.09.07 දින අංක 76 දරණ ගැසට් පත්‍රය

---

# තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම්

**උතුරු දිසාව—1971.02.01 සිට 1972.12..31 දක්වා වූ කාලසීමාව තුළ ටෙන්ඩර් පිළිබඳ ගත් තීරණයන් ප්‍රසිද්ධ කිරීම**

| අනුක්‍රමික අංකය | වැඩ/සේවය/සැපයීම පිළිබඳ විස්තර | ටෙන්ඩරයේ අවසාන දිනය | ලැබුණු ටෙන්ඩර් සංඛ්‍යාව | සාර්ථක ටෙන්ඩර්කරුවන්ගේ නම හා ලිපිනය | පිළිගත් මුදල |
|---|---|---|---|---|---|
| | | | | **වවුනියා දිසා කාර්යාලය** | |
| 1 ... | හිස් සිමෙන්ති කඩදාසි උර මිලදී ගැනීම හා ඉවත් කරගෙන යාම | 71.09.22 ... | 5 ... | පී. ආරුමුගම් මයා., 10, විහාර මාවත, කොළඹ 6 | එකක් ශත 37 බැගින් |
| 2 ... | හිස් තාර පීප්ප මිලදී ගැනීම හා ඉවත් කරගෙන යාම | 71.09.22 ... | 5 ... | එච්. ගුණරත්න මයා., 492, මීගමු පාර, පැලියගොඩ | පීප්පයක් රු. 3.55 බැගින් |
| 3 ... | නෙත්ති බාල්ක හා එසවුම් දඬු සහිතව අහල් 9යේ වාත්තු යකඩ සොරොව් ගේට්ටු වවුනියා දිසා වැඩ අධ්‍යක්ෂ ගබඩා අංගනය වෙත සැපයීම | 71.12.07 ... | 7 ... | හැරන් ඉන්ජිනියරින් වර්ක්ස් සමාගම, 478, කේ. සිරිල් සී. පෙරේරා මාවත, කොළඹ 13 | රු. 74,950 |
| 4 ... | උතුරු දිසාවේ වැඩ සඳහා ද්‍රව්‍ය ප්‍රවාහණය කිරීමේ වාහන හා පස් පෙරලන උපකරණ කුලියට සැපයීම | 72.01.24 ... | 6 ... | සීමාසහිත මාරපන තේ සමාගම, 29, වාල්ස් පෙදෙස, මොරටුව | (1) ඩී.4ඩී බුල්ඩෝසර පැයකට රු. 70 බැගින්<br>(2) ඩී6සී බුල්ඩෝසර පැයකට රු. 120 බැගින්<br>(3) ඩී.7ඊ බුල්ඩෝසරය පැයකට රු. 160 බැගින් |
| 5 ... | මුරුකන්ඩි–අක්කරායන්, වන්නේරි කුලම් පාරේ 8 වැනි 9 වැනි සැතපුම් වැඩ සඳහා කලුගල් හා සක්කගල් සැපයීම | 72.02.29 ... | 4 ... | එම්. සබානඩේසන් මයා., අරාලි, නැගෙනහිර වඩ්ඩුකොඩෙ | රු. 60,172 |

| අනුක්‍රමික අංකය | වැඩ/සේවය/සැපයීම පිළිබඳ විස්තර | ටෙන්ඩරයේ අවසාන දිනය | ලැබුණු ටෙන්ඩර් සංඛ්‍යාව | සාර්ථක ටෙන්ඩර්කරුවන්ගේ නම හා ලිපිනය | පිළිගත් මුදල |
|---|---|---|---|---|---|
| 6 ... | විස්වමඩුකුලම් වැව් බැම්මේ පහල කොටසට රොක් ටෝයි පිල්ටර යක් සැපයීම | 72.03.14 ... | 3 ... | පරන්තන් විවිධ සේවා සමුපකාර සමිතිය, පරන්තන් | රු. 57,515 |
| 7 ... | ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීමේ වාහන කුලි යට සැපයීම | 72.04.04 ... | 1 ... | එස්. එන්. පරරාජසිංහම් මයා., මාවිද්දපුරන් තැපැල් මහතා බාරේ, තෙල්ලිපලෙයි | (1) සිමෙන්ති හොණ්ඩරයක් :<br>1 වැනි සැතපුමට ශත 10 බැගින්<br>2 වැනි සැතපුමට ශත 07 බැගින්<br>(2) අඩි 3නේ හියුම් පයිප්ප :<br>නියමිත ගාස්තුව රු. 15යි, අමතර වශයෙන් ආපසු තොග පැටවුම් නොමැතිව සැතපුම් 10කට ශත 94 බැගින්<br>නියමිත ගාස්තුව රු. 15යි, ආපසු තොග පැටවුම් සහිතව සැතපුම් 10කට ශත 75 බැගින්<br>(3) වැලි සහ බොරලු :<br>කියුබ් එකකට රු. 8 බැගින් මුල් සැතපුමට<br>ඊලඟ සැතපුමකට රු. 3 බැගින්<br>(4) පස් කියුබ් එකකට :<br>මුල් සැතපුමට රු. 10 බැගින්<br>ඊලඟ සැතපුමකට රු. 3 බැගින්<br>(5) සක්ක කියුබ් එකකට :<br>මුල් සැතපුමට රු. 10 බැගින්<br>94ඊලඟ සැතපුමකට රු. 3 බැගින්<br>(6) කලුගල් කියුබ් එකකට :<br>මුල් සැතපුමට රු. 10 බැගින්<br>ඊලඟ සැතපුමකට රු. 3 බැගින්<br>(7) පැට්‍රල්, ඩීසල් ආදිය ගැලුමකට :<br>මුල් සැතපුමට ශත 02 බැගින්<br>ඊලඟ සැතපුමකට ශත 01 බැගින්<br>(8) එම්.එස්. පොලු හොණ්ඩරයකට<br>නියමිත ගාස්තුව රු. 15යි, ඊට අමතර වශයෙන් ආපසු තොග පැටවුම් නොමැතිව සැතපුම් 10 කට ශත 94 බැගින්වූ ගාස්තුවක්<br>ආපසු තොග පැටවුම් තිබේ නම් නියමිත ගාස්තුව රු. 15යි, ඊට අමතර වශයෙන් සැතපුම් 10 කට ශත 75 බැගින් වූ ගාස්තුවක් |
| 8 ... | හිස් සිමෙන්ති උර මිළදී ගැනීම හා ඉවත් කරගෙන යාම | 72.07.18 ... | 4 ... | ඒ. ඇලෝසියස් සේවියර් මහතා, 356, මීගමු පාර, වත්තල | වවුනියාව ලහම ස්ථානයෙන් උර යක් ශත 37 බැගින්<br>වවුනියාවෙන් සැ. 10ක් ඇතුළත උර යක් ශත 35 බැගින්<br>සැ. 10-20 දක්වා උරයක් ශත 31 බැගින්<br>සැ. 20 කින් ඔබ්බෙහි ශත 31 බැගින් |
| 9 ... | හිස් තාර පිප්ප මිළදී ගැනීම හා ඉවත් කරගෙන යෑම | 72.07.18 ... | 4 ... | එච්. ගුණරත්න මහතා, 211/36, මීගමු පාර, පැලියගොඩ | වවුනියාව ලහම ස්ථානයෙන් පිප්ප යක් 4.25 බැගින් |
| | | | | එන්. ජයවර්ධන මහතා, 397, මීගමු පාර, වත්තල | වවුනියාව ලහම ස්ථානයෙන් සැ. 10 ඇතුළත පීප්පයක් රු. 4.10 බැගින් |
| | | | | ඒ. ඇලෝසියස් සේවියර් මයා., 356, මීගමු පාර, වත්තල | වවුනියාව ලහම ස්ථානයෙන් සැ. 10-20 ඇතුළත පිප්පයක් රු. 3.67 බැගින් |
| | | | | ඒ. ඇලෝසියස් සේවියර් මයා., 356, මීගමු පාර, වත්තල | වවුනියාව ලහම ස්ථානයෙන් යැ. 20 කින් ඔබ්බෙහි පිප්පයක් රු. 3.67 බැගින් |
| 10 ... | හිස් වානේ පීප්ප මිළදී ගැනීම හා ඉවත්කරගෙන යෑම | 72.07.18 ... | 4 ... | ඒ. ඇලෝසියස් සේවියර් මයා., 356, මීගමු පාර, වත්තල | සෑම ස්ථානයකින්ම පීප්පයක් රු. රු. 5.50 බැගින් |
| 11 ... | උතුරු දිසාවේ විවිධ ව්‍යාපාරයන්හි සවිකිරීමට, තිබෙන සොරොව් දොරටු සඳහා එසවුම් දඬු, පිත්තල බෝස් සහ පින්ස් සැපයීම | 72.10.25 ... | 3 ... | හැරන් ඉංජිනියරින් වර්ක්ස්, 478/1 ඩී, කේ. සිරිල් සී. පෙරේරා මාවත, කොළඹ 13 | රු. 11,750 |

කිලිනොච්චිය ප්‍රාදේශිය කාර්යාලය

| | | | | | |
|---|---|---|---|---|---|
| 12 ... | විස්වමඩුකුලම් ව්‍යාපාරය සඳහා රෙජ් රජ් ආවරණ | 72.07.04 ... | 2 ... | එස්. සෙල්ලතුරෙයි මයා., තවාඩි දකුණ, කොකුවිල් | රු. 47,670 |

—————,
වැඩ අධ්‍යක්ෂ උතුරු දිසාව.

වවුනියාව.
1973 අගෝස්තු 18

ජ 9-119—73.09.07 දින අංක 76 දරන ගැසට් පත්‍රය

## රජයේ ගැසට් පත්‍රය මගින් කැඳවන ලද විවෘත ටෙන්ඩර් පිළිබඳ තීරණ

### ප්‍රාදේශීය සිවිල් ඉංජිනේරු සංවිධානය—බටහිර දිසාව

| සැපයීමේ/සේවයේ විස්තරය | ටෙන්ඩර් පත් පියවූ දිනය | ලැබූ ටෙන්ඩර් ගණන | පිළිගත් ටෙන්ඩර් කරුගේ නම හා ලිපිනය | පිළිගත් ටෙන්ඩරයේ මුදල |
|---|---|---|---|---|
| කැළණි උතුරු බැම්මේ 3 වෙනි සැතපුමට බොරළු කියුබ් 2,500 ක් සැපයීම | 1973.07.16 ... | 3 | ..., එච්. කේ. පෙරේරා මහතා, මාබිම, හෙයියන්තුඩුව කැළණිය | රු. 66,875 |

එන්. පී. ඒ. විජේසේකර,
වැඩ අධ්‍යක්ෂ වෙනුවට,
බටහිර දිසාව.

9-53—73.09.07 දින අංක 76 දරණ ගැසට් පත්‍රය

---

# බඩුබාහිරාදිය විකිණීම්

## දන්විමයි

පහත සඳහන් සතුන් පල්ලේකැලේ කුණ්ඩසාලේ එළිමහන් සිර කඳවුරු ගොවිපලේදී 1973 සැප්තැම්බර් මස 27 වෙනි දින පෙ. ව. 10 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. මෙම සතුන් ඉහත සඳහන් ගොවිපලේ දී සතියේ දිනවල උදේ 8 සිට සවස 2 දක්වාත් සෙනසුරාදා දිනවල උදේ 8 සිට 10 දක්වාත් බැලිය හැක.

1. ලාජ් වයිට් ඌරු පැටවුන් 10 යි.
2. ලාජ් වයිට් ඊරි පැටවුන් 10 යි.
3. ලාජ් වයිට් ඊරියන් 2 යි.

පී. ඩබ්ලිව්. පෙරේරා,
බන්ධනාගාර අධිකාරී.

එළිමහන් සිර කඳවුර,
පල්ලේකැලේ, කුණ්ඩසාලේ,
1973 අගෝස්තු මස 08.

9-68 —73.09.07 දින අංක 76 දරණ ගැසට් පත්‍රය

---

## මහේස්ත්‍රාත් උසාවිය—පුත්තලම

පහත සඳහන් අයිතිවාසිකම් දක්වා නැති සහ රාජසන්තක කරන ලද භාණ්ඩයන් සඳහා කල් ඇතිව අයිතිවාසිකම් දක්වා නොසිටින්නේ නම්, එකී භාණ්ඩයන් 1973.09.14 වැනි දින පෙ. ව. 9.30 ට කුරුණෑගල ප්‍රාදේශීය උසාවි පාලක ලේකම් එල්. ඒ. සී. බී. යකඳාවල මහතා ඉදිරියේදී උසාවි භූමියෙහි ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

භාණ්ඩයන් උසාවි භූමියේදී 1973. 09. 14 වැනි දින පෙ. ව. 8.00 සිට පෙ. ව. 9.00 දක්වා පරීක්ෂා කර බැලිය හැකිය.

ගැණුම්කරුවන් විසින් නොපමාව මුදල් ගෙවා භාණ්ඩයන් නොපමාව ඉවත් කර ගත යුතුය.

ආර්. පරමගුරු,
මහේස්ත්‍රාත්.

1973 අගෝස්තු මස 17 වැනි දින,
පුත්තලම, මහේස්ත්‍රාත් උසාවියේ දී ය.

| බයිසිකල් | විස්තර |
|---|---|
| නඩු අංකය ඒ.ආර්. 200/71 ... | අංක ඒ.ජේ. 93405 දරන බයිසිකල් රාමු 1 යි. |
| නඩු අංකය ඒ.ආර්. 87/72 ... | අංක 269801 දරණ බයිසිකල් 1 යි |
| නඩු අංකය ඒ.ආර්. 242/71 ... | අංක ඊ. පී. 270 දරණ රැලේ බයිසිකල් 1 යි. |
| නඩු අංකය එම්.සී.පී. 11532 ... | අංක ර්. ඒ. 2109 දරන රැලේ බයිසිකල් 1යි. |

| නඩු අංකය | විස්තර |
|---|---|
| 15503 | ... ඉස්සරහ ලාම්පු 2යි. |
| 16570 | ... පැට්‍රෝමැක්ස් (රෙඩ්හෑඩ්) ලාම්පු 1යි. |
| 17240 | ... පොරව 1යි. |
| 14431 | ... කැති 1යි. |
| 15082 | ... මන්නපිහි 1යි. |
| 4244 | ... ලන්තෑරුමක් සහ කෑලි පහේ විදුලි පන්දම් 1යි. |
| අංකයක් යොදා නැත | ... මන්න 1යි. |
| 18600 | ... කඳන් කියත් එකක් සහ පොරව 1යි. |
| ඒ.ආර්. 177/72 | ... රිම් එක සහිත ලොරි ටයර් 1යි. |
| ඒ.ආර්. 189/72 | ... බෝල මේස 1යි. |
| ප්ලාස්ටික් කෑන් 60 | ... බෙහෙත්ශාලා බෝතල් 25 යි. |
| ඇලුමිනියම් මුට්ටි 50 යි. | හිස්බෝතල් 250 යි. |
| බේසම් 2 යි. | ... හිස් බැරල් තොග 1යි. |
| ඇසිඩ් ජාර් 2 යි. | ... කුඩා ෂෝ කේස් 1යි. |

9-32 —73.09.07 දින අංක 76 දරණ ගැසට් පත්‍රය

---

## භාර ගනු නොලැබූ සහ අමතකව දමාගිය බඩු වෙන්දේසියක්

1973 සැප්තැම්බර් මස 28 වෙනි සිකුරාදා පෙරවරු 10 ට මරදාන දුම්රිය ස්ථානයේ නැති වූ බඩු පිළිබඳ කාර්යාලයේදී (ප්‍රවාහන අධිකාරිතැනගේ කාර්යාලයේ පහත් මාලයේදී) අමතකව දමාගොස් අයිතිවාසිකම් නොකරන ලද බඩු බාහිරාදිය වෙන්දේසියේ විකුණනු ලැබේ. මධ්‍යාහනයේ 12 සිට පස්වරු 1 දක්වා කෑම සඳහා වෙන්දේසිය නවත්වනු ලැබේ.

වෙන්දේසිය පවත්වනු ලබන දින, එම ස්ථානයේදී පෙරවරු 8.15 සිට පෙරවරු 9.45 දක්වා බඩු බාහිරාදිය බලත හැක.

ඩී. ටී. නවරත්න,
වැඩ බලන දුම්රිය සාමාන්‍යාධිකාරී.

නැ. පෙ. 355.
කොළඹ,
1973 අගෝස්තු මස 04 වැනි දින.

9-22 —73.09.07 දින අංක 76 දරණ ගැසට් පත්‍රය

---

## රේගුවේ වෙන්දේසියක්

කොළඹ රේගුවේ ඇලබෙද ගුදමේ තැන්පත් පහත සඳහන් බඩු 1973 සැප්තැම්බර් මස 11 වෙනි දින පෙ.ව. 9.30 ට එම ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. 1973 සැප්තැම්බර් මස 10 වෙනි දින එම බඩු ගැණුම්කරුවනට පරීක්ෂා කර බැලීමට පිළිවන.

ඉල්ලීම් අවසානයේදී වැඩිම ඉල්ලුම්කරු විසින් මිළයට ගන්නා භාණ්ඩයෙහි වටිනාකමින් 50%ක මුදලක් තැන්පත් කළ යුතුය.

මෙම වෙන්දේසියෙන් මිළයට ගන්නා බඩු වෙන්දේසිය අනුමත කර දින හතකින් ගෙන නොගියහොත් එම බඩු නැවත විකුණන බවත්, ඒ සඳහා ගෙවා ඇති අත්තිකාරම් මුදල් රාජසන්තක වන බවත් සැලකිය යුතුයි.

වෙන්දේසිය පිළිබඳ අනිකුත් කොන්දේසි සඳහා 1954 මැයි මස 28 වෙනි දින ගැසට් පත්‍රය බලන්න.

ඊ. බී. ඒ. දසනායක,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

මගේ අංකය : ඒඩී/1/73.
1973 අගෝස්තු මස 10 වන දින,
කොළඹ, ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේදීය.

**විස්තරය**

1. පාවිච්චි කරන ලද රෙදි තොගයක්
2. පෙට්ටි 2 වීදුරු තඹලේරු
3. කොමර්ට් 1
4. ගෝනි 68 මැටි
5. බේල් 15 කොහු ලනු
6. බේල් 6 රබර්
7. බේල් 150 බෙහෙත් පොතු (සින්කෝනා කොළ)
8. ගෝනි 20 පොල් කදන් අඟුරු
9. රීල්ස් 10 මුද්‍රිත කඩදාසි
10. පෙට්ටි 1 කාබන් කඩදාසි
11. පෙට්ටි 1 ඩිල්ටන් ඩයිනමෝ මීටර්
12. පෙට්ටි 1 විදුලි ට්‍රාන්ස්මීටර්ස් (2)
13. බෙර 6 මෙරයින් තෙල් (නැව් තෙල්)
14. හාඩ්බෝඩ් බෙර—6 රසායන ද්‍රව්‍ය
15. මලු 25 රසායන ද්‍රව්‍ය
16. මලු 6 රතු කොරල්
17. මලු 2 පාට කරන ද්‍රව්‍ය
18. පෙට්ටි 50 තේ
19. පැකේජ් 2 තේ පෙට්ටි බැටන්ස්
20. මලු 2 මැලියම්
21. 43 බන්දේසි
22. පොදි 100 කොහු ලනු
23. පොදි 20 කොහු ලනු
24. 14 ප්‍රයින් පෑන්ස් (ලොකු ප්‍රමාණය)
   3 ප්‍රයින් පෑන්ස් (කුඩා ප්‍රමාණය)
25. මලු 1/2 පුවක් (හානිවූ)
26. රීල්ස් 3 කටු කම්බි
27. කාටන් 1 හරිකේන් ලාම්පු
28. කාටන් 1 හිස් විස්කෝතු ටින්
29. රීල් 1 සෙලෝපේන් ටේප්
30. ගෝනි 1 ඇණ සහ මුරිච්චි
31. කාටන් 1 වීදුරු දීසි
32. ගෝනි 1 ටෝර්නර් දම්වැල්
33. කෑලි 4 නැව් අමතර කොටස්
34. කාටන් 1 ග්‍රීස්
35. තොග 1 කාඩ් බෝඩ්
36. 150 පී.වී.සී. පයිප්ප

**විස්තරය**

37. පොදි 1 කපු නූල්
38. බේල් 2 කඩදාසි
39. 1 පෝල්ජින් බෝල් (වීදුරු)
40. 2 ගිනි නිවන උපකරණ (පයර් එක්ස්ටින් ගුෂර්ස්)
41. පෙට්ටි 1 උදලු
42. පෙට්ටි 1 (2) ආර්මිචර්ස්
43. පෙට්ටි 1 මෝටර්කාර් ලාම්පු (වීදුරු කැබලි)
44. කාටන් 1 එප්සම් සෝල්ට් පැකට්
45. පෙට්ටි 1 "හීරෝ" ස්ටැම්ප් පෑඩ්ස්
46. කාටන් 1 පහත සඳහන් දෑ අඩංගු
   1. ස්ටැප් පැසෙන්ජර්ස්
   2. කෑලි දෙකක් පෑන් බෙල්ට්
   1. ලාම්පු (මෝටර් රථ සඳහා ඇන්ස කණ්ණාඩිය)
47. පෙට්ටි 1 මහන ඉඳිකටු
48. පෙට්ටි 1(1) මෝටර්
49. කාටන් 1 සෞඛ්‍ය තුවා
50. පෙට්ටි 1 ළදරු කමිස
51. පෙට්ටි 1 පාට කරන තීන්ත
52. පෙට්ටි 1 රෙදි පිළි වර්ග (හානිවූ)
53. පෙට්ටි 1 බැටරි (එක්සයිඩ්)
54. පෙට්ටි 1 ඉන්සියුලේටඩ් වයර්
55. කාටන් 1 කඩදාසි බෑග්
56. පෙට්ටි 1 කඩදාසි පැකට්
57. බේල් 1 රෙදි පිළි වර්ග
58. පෙට්ටි 1 චෝකින් පවුඩර්
59. පෙට්ටි 1 විලාඩ් සේප්ටි බෝල් (විලාඩ්)
60. කාටන් 1 ප්ලාස්ටික් බෝඩ්
61. රෝල් 3 ලනු පාපිසි
62. පෙට්ටි 1 සූට් කේස් (හිස්)
63. 6 ටයර් සහ ටියුබ්
64. කාටුන් 1 වීනිස් ස්පින්ඩල්ස්
65. කාටන් 1 පිත්තල ට්රේ (බන්දේසි)
66. පෙට්ටි 1 පරණ සපත්තු
67. පෙට්ටි 1 දොරවල් සඳහා සරනේරු
68. කොටන් 3 කැප්සූල් ටැබ්ලට්ස්

9-28—73.09.07 දින අංක 76 දරණ ගැසට් පත්‍රය

මගේ අංකය : ආ/10/71.

**ප්‍රසිද්ධ වෙන්දේසියක්**

මහේස්ත්‍රාත් උසාවිය—බලපිටිය

මෙම උසාවියේ නඩුවල රාජසන්තක කළ හා හිමිකම් නොපාන ලද මෙහි පහත සඳහන් භාණ්ඩද ඇතුළත් නවත් භාණ්ඩද, 1973 ක්වූ සැප්තැම්බර් මස 19 වැනි දින, පෙරවරු 9.00 ට බලපිටිය මහේස්ත්‍රාත් උසාවියේදී, ගාල්ලේ ප්‍රාදේශීය උසාවි පාලක ලේකම් ඉදිරිපිටදී, වෙන්දේසියේ විකුණන බවට, මහජනයාට මෙයින් දැනුම් දෙමි.

විකිණීමට නියමිත භාණ්ඩවල සම්පූර්ණ ලැයිස්තුවක් වෙන්දේසි දිනට සතියකට පෙර, උසාවි දැන්වීම් පුවරුවේ පළ කරනු ඇත.

බඩු මිළදී ගන්නන් විසින් එවේලේම මුදල් ගෙවා, බඩු ඉවත් කරගත යුතුයි.

එස්. ඔගස්ටින් සිල්වා,
මහේස්ත්‍රාත් බලපිටිය.

1973 අගෝස්තු 16 වැනි දින.

| නඩු අංකය | | භාණ්ඩය |
|---|---|---|
| 7801 බී/ඊ | ... | පිත්තල කළයක්. |
| 6869 බී/ඊ | ... | ලන්තෑරුමක්. |
| 7798 බී/ඊ | ... | ඉරුම් කියතක්. |
| 63377 | ... | මධ්‍යම ප්‍රමාණයේ වීදුරු 2 යි. කුඩා ප්‍රමාණයේ වීදුරු 6 යි. ලොකු වීදුරු 4 යි. |
| 63917 | ... | කැඩුනු මහණ මැසිමක කොටස්. මහණ මැසිමක මේසයක්. |
| 55979 | ... | මොණරා වර්ගයේ පාපැදියක්. ෆ්‍රේම් එකක් (බයිසිකල්). |
| 63864 | ... | රැලේ වර්ගයේ පාපැදියක්. |
| ඒ 1263/70 | ... | බී.එස්.ඒ. වර්ගයේ පාපැදියක්. |
| 50549 | ... | පැට්‍රොමැක්ස් ලාම්පු 1 යි. |

9-59 —73.09.07 දින අංක 76 දරණ ගැසට් පත්‍රය

**සේවයට නුසුදුසු වාහන ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

පහත සඳහන් සේවයට නුසුදුසු මෝටර් රථ, කඩවත, මාකොල පිහිටි මුඩිපර්ඩ් සහතික කළ පාසලේදී 1973.09.28 දින පෙරවරු 9.30 ට පටන් ගනු ලබන ප්‍රසිද්ධ වෙන්දේසියේදී විකුණනු ලැබේ.

1. අංක 2 ශ්‍රී 6362 දරණ ෆේජ්ක්ස් වාගන් කෝම්බි වෑන්රථය.

2. අංක 4 ශ්‍රී 1988 දරණ ස්ටෑන්ඩඩ් 10 වෑන්රථය.

2. එක් එක් වාහනය වෙන්දේසියේ තීන්දු වන විටම වැඩිම ලංසුව තැබූ අය විසින් එම මිළ ගණනින් 50% ක අත්පිට මුදලක් තැන්පත් කළ යුතුය. ඉතිරි මුදල රථය ඉවත්කර ගැනීමට පෙර එනම් වෙන්දේසි කළ දින සිට දින හතක් ඇතුළත ගෙවිය යුතුය.

3. එසේ ඉතිරි මුදල් ගෙවා දින හතක් තුල වාහනය මිළයට ගත් අය විසින් එය ඉවත්කර නොගතහොත් ඉහතකී තැන්පත් මුදල රාජ සන්තක වන්නේ ය.

4. එම වාහන ඉහතකී පාසලේදී මහජනයා විසින් පරීක්ෂාකර බැලීම සඳහා සතියේ සාමාන්‍ය වැඩකරන දිනවල පෙරවරු 9 සිට පස්වරු 3 දක්වා ද, සෙනසුරාදා දිනවල පෙ.ව. 9 සිට 11.30 දක්වා ද ඉඩ සලසා ඇත.

එන්. කේ. ඒ. ද සිල්වා,
පරිවාස හා ළමාරක්ෂක සේව කොමසාරිස්.

8-26 —73.09.07 දින අංක 76 දරණ ගැසට් පත්‍රය

## බඩු බාහිරාදිය විකිණීම

කෑගල්ලේ රජයේ රෝහලේදී අයිතිකරුවන් නොමැතිව මළ රෝගීන්ගේ බඩු බාහිරාදිය හා එම රෝගීන් පිළිබඳ විස්තර පහත ඇති සටහනෙහි දක්වේ. එම බඩු බාහිරාදිය ඉල්ලුම් කිරිමට අයිති කරුවන් ඇතොත් අද දින සිට සති තුනක් ඇතුළත ඒවා ලබා ගැනීමට කෑගල්ලේ දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරි තැනගෙන් පුළුවන. එම කාලසීමාව තුළ යම් අයිති කරුවෙක් ඉදිරිපත් නොවුවහොත් එම බඩු ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන බවත් ඉන් ලැබෙන මුදල් රජයේ ආදායමට බැරකරන බවත් මෙයින් දනුම් දෙමි.

සටහන

| ඇතුලත් වීමේ අංකය | මළ රෝගීන්ගේ නම | පදිංචිය | ඇතුලත්වූ දිනය | මළ දිනය | කරාබු | මුදු | වළලු | සුර | හම පටි | යතුරු | මුදල් රු. ශ. |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 47062 | කේ. ඩබ්ලිව්. පොඩි බණ්ඩා | සඳහන්ව් නැත | 30.10.68 | 1.11.68 | — | 1 | — | — | — | — | — |
| 9353 | පොන්නම්මා | ජේන් නෝනා බාරේ, පන්සල පාර, කෑගල්ල | 31.03.69 | 17.04.69 | 2 | — | — | — | — | — | — |
| 24686 | ඇල්. පොඩිඅප්පු | සඳහන්ව් නැත | 06.07.70 | 27.07.70 | — | — | — | — | — | — | 55 43 |
| 9117 | ලොකුමැණිකා | ඇම්. පී. යසවති මැණිකේ බාරේ, මුරුතවල, මාවනැල්ල | 22.03.71 | 29.03.71 | 2 | — | — | 1 | — | — | — |
| 12070 | පී. සෙලෙත්තු | ඩී. ඩිංගිරියා බාරේ, හාල්මැස්ස, උඩුගොඩ | 10.05.71 | 10.05.71 | — | — | 2 | — | — | — | — |
| 34544 | මළ රෝගියාගේ නමක් නැත | ඇන්. කේ. ජයරත්න, වැවතැන්න, හෙට්ටිමුල්ල | 04.12.71 | 06.12.71 | — | — | — | — | — | — | 25 32 |
| 30421 | ඒ. විමලාවතී | ඇස්. එච්. ඇලිස් බාරේ, දිඹුල්ගමුව, කෑගල්ල | 26.10.72 | 26.10.72 | 2 | — | — | — | — | — | — |
| 34312 | නම සඳහන්ව් නැත | එච්. ජයසිංහ බාරේ, රංජනී හෝටලය, කෑගල්ල | 28.11.72 | 28.11.72 | — | — | — | — | 1 | 2 | 2 45 |
| 3653 | හාමිනෝනා | ඇම්. ඒ. පොඩිමහත්මයා බාරේ, දෙල්ගමුව, වරකාපොල | 30.01.73 | 01.02.73 | 2 | 1 | — | — | — | — | — |
| 10852 | කේ. ඇම්. සෝමාවතී | ඇම්. හෙන්ද්‍රික් අප්පුහාමි බාරේ, මංගෙදර, ගස්නාව | 31.03.73 | 07.04.73 | 2 | — | — | — | — | — | — |
| | | | | එකතුව | 10 | 02 | 02 | 01 | 01 | 02 | 83 20 |

ඩී. බී. නියංගොඩ,
සෞඛ්‍ය සේවා අධිකාරී,
කෑගල්ල.

1973 අගෝස්තු මස 23 වනද,
සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලය,
කෑගල්ල.

9–78—73.09.07 දින අංක 76 දරණ ගැසට් පත්‍රය

---

## මතුගම මහෙස්ත්‍රාත් උසාවියේ භාණ්ඩ වෙන්දේසිය

පහත සඳහන් භාණ්ඩ මතුගම මහෙස්ත්‍රාත් උසාවියේදී 1973 සැප්තැම්බර් මස 29 වෙනි දින පෙරවරු 10.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

| නඩු අංකය | විස්තරය | |
|---|---|---|
| 17505 | කිරි පිහියා | 1 යි |
| 18049 | එම | 1 යි |
| 18332 | එම | 1 යි |
| 18775 | එම | 1 යි |
| 15289 | ප්ලාස්ටික් බැරල් | 1 යි |
| 16481 | එම | 1 යි |
| 23722 | එම | 1 යි |
| 24058 | එම | 1 යි |
| 15289 | විදුරු ජාර් | 1 යි |
| 23934 | මැණික් ගරන කුඩා | 1 යි |
| 24431 | එම | 1 යි |
| 24556 | එම | 1 යි |
| 24557 | එම | 2 යි |
| ජ්322/73 | එම | 1 යි |
| ජ්323/73 | එම | 1 යි |
| ජ්324/73 | එම | ... |
| 16905 | මන්නා | 2 යි |
| 20871 | එම | 1 යි |
| 21034 | එම | 1 යි |
| 22917 | එම | 1 යි |
| 18370 | පිහියා | 1 යි |
| 19899 | කොපි පොත් | 62 යි |
| 12201 | උදළු | 1 යි |
| 21024 | එම | 1 යි |
| 22686 | එම | 1 යි |
| 24556 | එම | 1 යි |
| ජ්323/73 | එම | 2 යි |
| 14944 | කැති | 1 යි |
| 18370 | එම | 1 යි |
| 19287 | එම | 1 යි |
| 19780 | එම | 2 යි |
| 21940 | එම | 1 යි |
| 22686 | එම | 1 යි |
| 16905 | කපනකටු | 9 යි |
| 21303 | ලොකු කියත් | 1 යි |
| 24556 | බාල්දි | 2 යි |
| 24557 | බාල්දි | 1 යි |
| ජ් 358/73 | හරස් කියත් | 1 යි |
| 11823 | රැලේ බයිසිකල් | 1යි |
| 16348 | හම්බර් බයිසිකල් | 1 යි |

වෙන්දේසි කරනු ලබන භාණ්ඩ වැඩිම ඉල්ලුම්කරුට හිමිවන අතර වෙන්දේසිය පැවැත්වීමේදී තීන්දු කරනු ලබන මුදල එම ස්ථානයේ වෙන්දේසිය පවත්වනු ලබන නිලධාරියාට ගෙවා කුවිතාන්සියක් ලබාගත යුතුය. බඩු මිලට ගනු ලබන්නා වෙන්දේසිය අවසානයේදී එම බඩු උසාවි භූමියෙන් ඉවත් කර ගත යුතුය.

එල්. එම්. ජයරත්න,
මතුගම මහෙස්ත්‍රාත්.

1973 අගෝස්තු මස 28 වෙනි දින,
මතුගම මහෙස්ත්‍රාත් උසාවියේදී ය.

9–120—73.09.07 දින අංක 76 දරණ ගැසට් පත්‍රය

## තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

**පුත්තලම දිස්ත්‍රික්කයේ අංක 2 කුරුවිකුලම අරක්කු තැබෑරුමේ රේන්දය 1973.10.01 දින සිට 1973.12.31 දක්වා කාලය සඳහා නැවත විකිණීම**

1973 ඔක්තෝබර් මස 01 දින සිට 1973 දෙසැම්බර් මස 31 දක්වා කාල සීමාව තුල, කුරුවිකුලම අරක්කු තැබෑරුමේ අරක්කු සිල්ලරට විකිණීමේ වරප්‍රසාදය මිලදී ගැනීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1973 සැප්තැම්බර් මස 17 දින, පෙරවරු 9 සිට 10 දක්වා කාලය තුල මා විසින් මෙම කාර්යාලයේදී භාරගනු ලැබේ. මෙම ටෙන්ඩර් පත්‍ර භාරගනු ලබන්නේ 1972.11.17 දින අංක 34 දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පලවූ, 1973 වර්ෂයේ අරක්කු තැබෑරුම් රේන්ද විකිණීම පිළිබඳව මවිසින් පළකරවන ලද කොන්දේසිවලට යටත් වය.

ඩ. සු. විජේපීර,
**පුත්තලම දිසාපති.**

1973 අගෝස්තු මස 28 දින,
පුත්තලම දිසාපති කාර්යාලයේ දිය.

9-64—73.09.07 දින අංක 76 දරණ ගැසට් පත්‍රය

---

## වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම්

**මාතර දිස්ත්‍රික් උසාවියේදිය**

උගස් නඩු තීන්දුවක් යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියක් නඩු අංක ඇම්. බී. 2099

1 මාතර, කොටුවේ ශ්‍රී ධර්මාරාම මාවත, අංක 30ඒ හි පදිංචි සිරියලතා අබේසූරිය ........................................ පැමිණිලිකරු.

**එදිරිව**

මාතර, ගන්දර පදිංචි ලොකු ගන්හේවගේ පීටර් සිල්වා ........................................ විත්තිකරු.

ඉහත කී නඩුවෙන් මට ලැබී තිබෙන බලය පිට ඉහත සඳහන් විත්තිකරුගෙන් පැමිණිලිකාර මහත්මියට අය විය යුතු රු. 6950 ක්ද 1972 ක්වූ අප්‍රේල් මස 21 දින සිට තීන්දුව දෙන දින දක්වා එනම් 1972.04.21 සිට 21.11.72 දක්වා වන්නාවූ සියයට 18 පොලියද, එකී මුල් මුදල සහ පොලිය එකතු කල මුලු මුදල ගෙවා නිමවනතුරු නීත්‍යානුකූල පොලියද ගාස්තුව පසුව අයකර ගැනීමේ බලය ඇතිව එකී මුදල වන රු. 10,489. 20 වන මුදල අයකර ගැනීම සඳහා මෙහි පහත සඳහන් දේපල වර්ෂ 1973 ක්වූ සැප්තැම්බර් මස 29 දින උදේ 10 ට පළමු ඉඩමද, 10.30 ට දෙවන ඉඩමද, 11 ට තුන්වන ඉඩමද, පිළිවෙලින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**ඉඩමේ විස්තර :**

1. දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ මාතර කඩවත් සතර තුළ මැද්දෙවත්තේ පිහිටි ලක්සෙවත්ත ඉඩමෙන් බෙදා වෙන් කරන ලද සී 2 බී දරණ කැබැල්ලට මායිම්, උතුරට : මහ පාර සහ මෙම ඉඩමේ ඊ අක්ෂරය දරණ කැබැල්ලද, නැගෙනහිරට : මහපාර සහ මෙම ඉඩමේ සී 2 ඒ දරණ කැබැල්ලද, දකුණට : මෙම ඉඩමේ සී 1 ඒ සහ සී 1 බී දරණ කැබලිද, බස්නාහිරට : මෙම ඉඩමේ බී අක්ෂරය දරණ කැබැල්ලද යන මායිම් තුළ පර්චස් 25 ක් (අ. 0, රූ. 0, පර්. 25) විශාල ඉඩමේ සියලු ගස කොළ පළතුරු සමග බිමද,

2. ඉහත කී මැද්දේවත්තේ පිහිටි ලක්සෙවත්තේ ඉඩමෙන් බෙදා වෙන් කරන ලද ඊ අක්ෂරය දරණ කැබැල්ලට මායිම් : උතුරට : මහ පාරද, නැගෙනහිරට : මෙම ඉඩමේ සී අක්ෂරයෙන් වෙන් කළ සී 2 බී දරණ කැබැල්ල සහ සී 1 බී දරණ කැබැල්ලද, දකුණට : මෙම ඉඩමේ සී 1 බී දරණ කැබැල්ලද, බස්නාහිරට : මෙම ඉඩමේ ඒ සහ බී යන අක්ෂර දරණ කැබලිද, යන මායිම් තුළ පර්චස් දහයක් (අ. 0, රූ. 0, පර්. 10) විශාල ඉඩමේ සියලු ගස කොළ පලතුරු සමග බිමද වේ.

3. ඉහත කී මැදදේවත්තේ පිහිටි ලක්සෙවත්ත ඉඩමෙන් බෙදා වෙන් කරන ලද සී 1 බී දරණ කැබැල්ලට මායිම්, උතුරට : පාරක් සඳහා වෙන් කරන ලද ඊ අක්ෂරය දරණ කැබැල්ල සහ මෙම ඉඩමේ සී 2 බී දරණ කැබැල්ලද, නැගෙනහිරට : මෙම ඉඩමේ සී 1 ඒ දරණ කැබැල්ලද, දකුණට : නාජ්පෙවත්ත සහ මෙම ඉඩමේ කැබැල්ලක්ද, බස්නාහිරට : මෙම ඉඩමේ බී අක්ෂරය දරණ කැබැල්ලද යන මායිම් තුල පර්චස් විස්සක් (අ. 0, රූ. 0, ප. 20) ක් විශාල ඉඩමේ සියලු ගස කොළ පළතුරු සමග හා එම කැබැල්ලට යාමට තිබෙන පාරේ යෑම් ඊම් බලයද වේ.

වැඩි විස්තර මාතර නීතිඥ සහ සාමවිනිසුරු සහ නිලනොලත් මහෙස්ත්‍රාත් සී. ඇස්. පිනිදිය මහතාගෙන් හෝ මගෙන් විමසන්න.

ජාන් ද සිල්වා සපුකොටන,
උසාවියේ වෙන්දේසිකාර කොමසාරිස් තැනැ.

නො. 14, ශ්‍රී ධර්මාරාම මාවත,
කොටුව-මාතර,
1973 අගෝස්තු 24.

9-97—73.09.07 දින අංක 76 දරණ ගැසට් පත්‍රය

## ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ

# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරනු ලබන සංශෝධිත ගාස්තු

1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට ක්‍රියාත්මක වේ

(සෑම සිකුරාද දිනයන්හි පළ කරනු ලැබේ)

1. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.**

2. **පෞද්ගලික පළ කරන්නන්ගේ** සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් **සමග කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති** තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. සෙනසුරාද පෙරවරු 8 සිට දහවල් 12 දක්වා ද, වෙනත් දිනවල පෙරවරු 8 සිට පස්වරු 3.30 දක්වා ද කාර්‍යාලයේ කටයුතු කරන කාලය බව සැළකිය යුතුයි.

4. සෙනසුරාද පෙරවරු 11 ට සහ වෙනත් දිනවල පස්වරු 2.30 ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි.** තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශන **යන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.**

6. ප්‍රමාදය සහ දෙස් වළක්වා ගැනිම සඳහා, පළකරන්නට නියමිත '' පිටපත '' කඩදසියේ **එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි.** ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. **සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.**

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ පනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.

10. 1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරන ගාස්තු මෙසේයි :—

| | රු. | ශ. |
|---|---|---|
| අහලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 20 | 0 |
| වැඩි වන සෑම අහලකට හෝ ඉන් කොටසකට ... ... | 20 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 220 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... | 440 | 0 |

අහලේ සෑම කොටසකටම සම්පූර්ණ අහලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. **සෑම සිකුරාද දිනයකම ශ්‍රී ලංකා ජනරජයේ '' ගැසට් '' පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින** අතරට පැමිණෙන සෑම සතියකදී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. **1966 මාර්තු 1 වෙනිද සිට ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ, මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි.**

13. 1968.12.1 දින සිට සංශෝධිත දායක ගාස්තු :—

**ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය—වාර්ෂික**

| | මෙරට රු. ශ. | | පිටරට රු. ශ. |
|---|---|---|---|
| එක් කොටසක් ... ... ... | 46 0 | ... | 60 0 |
| I වැනි කොටසේ එක ඡෙදයක් ... ... | 36 0 | ... | 42 0 |
| I වැනි කොටසේ ඡෙද දෙකක් ... ... | 43 50 | ... | 51 50 |

**වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ නිම වන සේ දායක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට නො අඩු කාලයකට පමණය.**

***තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)**

| | මිළ රු. ශ. | | තැපැල් ගාස්තු මෙරට රු. ශ. |
|---|---|---|---|
| (අ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළතදී, එක කොටසක් ... ... | 0 50 | ... | 0 20 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, එක කොටසක් ... ... ... | 1 0 | ... | 0 20 |
| (ආ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළත දී, I වැනි කොටසේ එක ඡෙදයක් ... | 0 30 | ... | 0 15 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු I වැනි කොටසේ එක ඡෙදයක් ... | 0 60 | ... | 0 15 |

**දායක මුදල් බාර ගැනීම සහ තනි පිටපත් විකිණීම බාර, කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.**

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊලඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහාලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරි වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

### 1973

| මාසය | පළකිරීමේ දිනය | | | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | | |
|---|---|---|---|---|---|---|---|
| අගෝස්තු | 73.08.03 | සිකුරාද | ... | 73.07.25 | බදාදා | දවල් | 12.00 |
| | 73.08.10 | සිකුරාද | ... | 73.08.01 | බදාදා | දවල් | 12.00 |
| | 73.08.17 | සිකුරාද | ... | 73.08.08 | බදාදා | දවල් | 12.00 |
| | 73.08.24 | සිකුරාද | ... | 73.08.15 | බදාදා | දවල් | 12.00 |
| | 73.08.31 | සිකුරාද | ... | 73.08.22 | බදාදා | දවල් | 12.00 |
| සැප්තැම්බර් | 73.09.07 | සිකුරාද | .. | 73.08.29 | බදාදා | දවල් | 12.00 |
| | 73.09.14 | සිකුරාද | .. | 73.09.05 | බදාදා | දවල් | 12.00 |
| | 73.09.21 | සිකුරාද | ... | 73.09.11 | අඟහරුවාද | දවල් | 12.00 |
| | 73.09.28 | සිකුරාද | ... | 73.09.19 | බදාදා | දවල් | 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 ඔක්තෝබර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.